# පත්තිනි දේව ඇදහිල්ල පිළිබඳ මානවංශ විද්‍යාත්මක අධ්‍යයනයක් (මාතලේ අම්බොක්ක ශ්‍රී පත්තිනි දේවාලය ඇසුරින්)

ඩබ්ලිව්.ඩබ්ලිව්.එම්.කේ.ජී.ඩබ්ලිව්.සී.පී.කේ. විජේරත්න[1]

මුඛ්‍ය පදඃ පත්තිනි ඇදහිල්ල, බැතිමතුන්, සමාජයක්

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දේවාල සංස්කෘතිය තුළ පත්තිනි දේව ඇදහිල්ල ඉතා සුවිශේෂී ස්ථානයක් ගනු ලබයි. ගජබා රාජ්‍යකාලය දක්වා දිවෙන පත්තිනි ඇදහිල්ල ලංකාවේ සිංහල හා දෙමළ සංස්කෘතීන් තුළ ඉතාමත් හරිසරින් වැළඳ ගත් ආගමික අංගයක් ලෙස සැළකිය හැකිය. මෙලෙස වන්දනාමානයට පත්වන පුරාවිද්‍යාත්මක ඓතිහාසික හා මානවංශ විද්‍යාත්මක හා අස්පර්ශීය උරුම සම්බන්ධ වටිනාකමක් වැදගත්කමක් ඇති ස්ථානයක් ලෙස මාතලේ අම්බොක්ක ශ්‍රී පත්තිනි දේවාලය හඳුනාගත හැකිය. මාතලේ අම්බොක්ක ශ්‍රී පත්තිනි දේවාලයේ මානවවංශ පැතිකඩ කෙබඳුද යන්න සෙවීම මෙම පර්යේෂණයේ ගැටලුවයි.

## ක්‍රමවේදය

පත්තිනි දේව ඇදහිල්ල හා මිනිසා කෙතරම් බැඳී පවතින්නේද මිනිස් චර්යාවන්ට කෙතරම් බලපානවාද යන ගැටලුවට අදාළව සිදු කරනු ලබන මෙම පර්යේෂණය අධ්‍යයනයට අවශ්‍ය දත්ත රැස්කිරීම සඳහා පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය හා ක්ෂේත්‍ර අධ්‍යයනය උපයෝගී කරගන්නා ලදී. පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය යටතේ ද්විතීක මූලාශ්‍රය පරිශීලනයෙන් දත්ත ලබාගන්නා ලදී. ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය සඳහා මාතලේ අම්බොක්ක ග්‍රාමය අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගත් අතර එහිදී අහඹු නියදි ක්‍රමය යටතේ දේවාලය හා නිතැතින්ම සම්බන්ධ වන පුද්ගලයින් කිහිප දෙනෙකු තෝරාගෙන ගැඹුරු සම්මුඛ සාකච්ඡා ක්‍රමයට යටතේ දත්ත ලබා ගන්නා ලදී. එම ලබාගත් ගත්ත අදාල කාණ්ඩවලට වෙන්කරමින් තේමාගතකරණය යටතේ දත්ත විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම සිදුකිරීම සිදුකරන ලදී. ඉන්පසු එම දත්ත සන්සන්දනය කරමින් අවසාන වශයෙන් නිගමනවලට පැමිණීමට කටයුතු කර ඇත.

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය
ssh2020519@ssh.rjt.ac.lk

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

පත්තිනි දේව සංකල්පය බිහිවීම පිළිබඳ අවධානය යොමු කිරීමේදී පත්තිනි උපත සහ ජීවිත කතාව පිළිබඳ විවිධ කතා පුවත් කිපයක්ම හඳුනාගත හැකි අතර සාරාංශගත විස්තරය අනුව තම ස්වාමියා වූ පාලක කුමරු හෙවත් කෝවලන්ට අසාධාරණය තීන්දුවකට ලක්ව මුහුණ පෑමට සිදුවූ මරණයට එරෙහිව දරුවන්, ගුණවත් කාන්තාවන් සහ සතුරන් හැර සියල්ල විනාශ වන්නට සාප කර පඬි නුවර වනසා නැවත එම ගින්න නිවා දමා භාවනානුයෝගීව වැඩවසා පතිනිය ලෙස දේවත්වයට පත්ව ඇත.

පත්තිනි දෙවඟන සම්බන්ධව සත්පත්තිනි, දොළොස් පත්තිනි යනුවෙන් ප්‍රභේද පවතින අතර එම ප්‍රභේද හරහා පත්තිනි දෙවඟන උපන් ආත්ම භවයෙන් පිළිබඳව කරුණු ඉදිරිපත් කරයි. පත්තිනි දේවිය සශ්‍රීකත්වයේ හා නිරෝගී භාවයේ සංකේතයක් ලෙසද එඩිතර බව, පවිත්‍රතාවය, තේජාන්විත භාවය ආදී යහපත් ගුණාංග රාශියක් පත්තිනි දේවිය වෙත ඒකරාශී වීමෙන් පත්තිනි දෙවඟන සුවිශේෂීත්වයට පත්ව ඇත.

පත්තිනි ඇදහිල්ල ලක්දිව ජනයාගේ දේව වන්දනයට පත්වීම සම්බන්ධයෙන් මතවාද කිහිපයක් පවතින අතර කෝට්ටේ රාජධානි සමයේ ගජබා රජ දවස පත්තිනිදේව ඇදහීම ලංකාවට පැමිණ ඇති අතර මායාදුන්නෙ, සීතාවක රාජසිංහ, විමලධර්මසූරිය වැනි රජවරුන්ගේ රාජ්‍ය අනුග්‍රහය පත්තිනි දේව ඇදහිල්ලට ලැබුණ අතර තවද ලංකාව තුළ පත්තිනි සළඹ හතක් ඇති බවට මතයක් පවතී.

ශ්‍රී ලංකාව තුළ පත්තිනි ඇදහීම හා බැඳුණු ප්‍රධාන ශාන්ති කර්ම වශයෙන් ගම්මඩු ශාන්ති කර්මය, කිරිඅම්මාවරුන්ගේ දානය ආදියත් ලෙඩ රෝග හා විපත් ආදියෙන් ආරක්ෂා වීම සඳහා පත්තිනි දෙවියන්ට භාරවීම සිරිතක් වශයෙන් සිදුවේ.

ශ්‍රී ලංකාවේ පත්තිනි දේව ඇදහිල්ල ප්‍රබලව දක්නට ලැබෙන අම්බොක්ක ශ්‍රී පත්තිනි දේවාලය මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුර උඩසිය පත්තුවේ පල්ලේපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අම්බොක්ක කඳු පාමුල අම්බොක්ක ශ්‍රී පත්තිනි දේවාලයේ පිහිටා තිබේ. ශ්‍රී ලංකාවේ පත්තිනි දේවාල අතරින් ඉපැරණිතම දේවාලයක් ලෙසත් පුරාවිද්‍යා ආරක්ෂිත ස්ථානයක් වශයෙන් ද මෙය ප්‍රකාශයට පත්කර ඇති ස්ථානයකි.

වළගම්බා රාජ්‍යකාලය දක්වා දිවෙන මෙම අම්බො ක්ක ශ්‍රී පත්තිනි දේවාලය තුළ පත්තිනි වන්දනය සිදුකරන කරගෙන යනු ලබන අතර පත්තිනි දේව ඇදහිල්ල පතිභක්තියට පමණක් සීමා නොවී මුළු මහත් රටවැසියන්ගේම නිරෝගී බව හා සශ්‍රීකත්වය අරමුණු කොට ගෙන වර්තමානය වන විට වර්ධනය වී ඇත. මෙම අම්බොක්ක ශ්‍රී පත්තිනි දේවාලය තුළ රාජකාරී පංගු 18ක් යටතේ මුබ පරම්පරාවන් ඔස්සේ සිදු කරගෙන යනු ලබන අතර වසරක් පාසා කාති මංගල්‍යය, අලුත් සහල්

මංගලය, නානුමුර මංගල්‍යය, කප සිටුවීමේ මංගල්‍යය, පෙරහැර මංගල්‍යය ලෙස පූජා විධි සිදු කරන අතර මුළු මහත් සමාජයටම නිරෝගී බව හා සශ්‍රීකත්වය එමගින් අපේක්ෂා කරයි. තවද ගම්මඩු ශාන්තිකර්මය, පහන්මඩු ශාන්තිකර්මය මගින් පත්තිනි දේව ඇදහිල්ල හා එම පූජා විධිවලට අමතරව පත්තිනි දේව සංකල්පය වටා බැඳි ජන ක්‍රීඩා ආදිය ද පවතින අතර එම ක්‍රීඩා අතර අං කෙළිය, පොරපොල් ගැසීම, අම්බොක්ක පත්තිනි දේවාලයට ආවේණික වූ දොඩම් කෙළිය නැටුම ඉතා ජනප්‍රිය බවත් වර්තමානය වන විටත් මෙම අම්බොක්ක දේවාලයෙහි පෙරහැර මංගල්‍යය පවත්වනු ලබන කාලයේදී සිදු කරනු ලබන බව අනාවරණය විය.

එපමණක් නොව පත්තිනි මෑණියන් වෙනුවෙන් දෙනු ලබන කිරිඅම්මා දානය, මල් කුමාරි මල් කුමාර දානය තුළින් ද අපේක්ෂා කරන්නේ නිරෝගී බව සෞභාග්‍ය බව දායකයන්ගේ ප්‍රකාශ මගින් පෙනී ගිය කරුණකි. ඒ අනුව මානව වර්ගයාට යහපත් අයුරින් බලපෑම් සිදුකිරීමට පත්තිනි දේව සංකල්පය උපකාරි වී ඇති බව පෙන්වා දිය හැක.

අම්බොක්ක ශ්‍රී පත්තිනි දේවාලයෙහි පත්තිනි ඇදහිල්ල හේතුවෙන් මිනිසාගේ සාරධර්මවලට හා ආකල්ප වර්ධනයට බලපාන ලද චාරිත්‍ර වාරිත්‍ර රාශියක් මෙම පත්තිනි දේවාලයෙහි පත්තිනි ඇදහිල්ල තුළ ගැබ් වී ඇත. නිරෝගී බව රටේ සාමය කළට වේලාවට වැසි ලැබීම කෘෂිකාර්මික කටයුතු සරුසාරවීම රටෙහි සෞභාග්‍ය උදාවීම ආදී අරමුණු ප්‍රමුඛ කොට ගෙන ලක්ෂ සංඛ්‍යාත පිරිසක් මෙම අම්බොක්ක ශ්‍රී පත්තිනි දේවාලයෙහි පත්තිනි මෑණියන් වෙනුවෙන් පුද පූජා පවත්වන අතර එම අවස්ථාවලදී මස් මාළු අනුභවයෙන් තොරව එම පූජා විධි පැවැත්වීමට පවා ජනයා කටයුතු කර ඇත්තෙ පත්තිනි මෑණියන් කෙරෙහි පවතින දැඩි භක්තිය නිසාවෙනි.

සමාලෝචනය

මාතලේ අම්බොක්ක ශ්‍රී පත්තිනි දේවාලය සංස්කෘතික ආගමික සමාජය වශයෙන් පැරණි මහා ඉතා වැදගත් ස්ථානයක් වන අතර මෙම ස්ථානය තුළ ජන ජීවිතයේ විවිධ අවස්ථාවලට දේව බලපෑම දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගනිමින් ඒ හා බැඳි විශ්වාස තුළින් මිනිස් සමාජය ලෞකික වශයෙන් මෙන්ම ලෝකෝත්තර වශයෙන් ද වැදගත් බවත් මානවංශ විද්‍යාත්මක තොරතුරු බොහෝ ප්‍රමාණයක් ලබාගත හැකි ස්ථානයක් ලෙසත් හඳුනාගත හැකි ස්ථානයකි.

ආශ්‍රිත මූලාශ්‍රය

ලගමුව, ආරිය. (2015). ***පත්තිනි දෙවියෝ ආදිවාසී කිරි අම්මලා හා කිරි අම්මා දානය (සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්).*** අතුරුගිරියඃ අම්ල ප්‍රකාශකයෝ.

සෙනෙවිරත්න, **අනුරාධ. (2003).** ***පත්තිනි දේව අනුහස ලක්දිව බුදු සසුන හා සිංහල සංස්කෘතිය (ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය).*** කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

කාරියවසම්, තිස්ස. **(1991).** ***සිරිලක දෙවිවරු.*** කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.